**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2015**

-----------------------------------------------------

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

--------------------------------------------

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

ඉකුත් වර්ෂයට අදාල වියදම් රු.5,991,999 ක් අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරීම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07**

i. මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 10,140,271 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල සත්‍ය වෙළඳපොල අගය නිරූපණය වන පරිදි වර්ෂ 5 කට වරක්වත් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් භාවිතා කරන 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.23,801,980 ක් වූ වාහන, පිරියත හා උපකරණ සහ පරිගණකවල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.10.2 යටතේ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ආයතනය ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ගිණුම් තබා නොතිබූ අතර රජයේ ප්‍රාග්ධන ප්‍රදාන සමුච්චිත ලාභයට එකතු කර දක්වා තිබුණි. ඒ අනුව රාජ්‍ය ප්‍රදාන මගින් ගොඩනගන ලද වත්කම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

ආයතනය මගින් මෙහෙයවනු ලැබූ පාඨමාලාවන් සඳහා රාජ්‍ය ආයතන 3 කින් ලැබිය යුතු එකතුව රු. 2,560,915 ක් වර්ෂ 01 සිට වර්ෂ 02 අතර කාල පරාසයක සිට හිඟ හිටව පැවතුණි.

### 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 08 වගන්තිය | මණ්ඩලයේ බලතල ක්‍රියාවට නැංවීමට අවශ්‍ය රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලියා හැරි වටිනාකම රු.14,673,373 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.17,595,314 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.478,601 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,116,713 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වර්ධනයට අපේක්ෂිත පරිදි පුහුණු වැඩසටහන් 180 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු රු. 8,405,568 ක් අදාළ පුහුණු කටයුතු සඳහා යොදා නොගෙන ආදායම් ලෙස ගිණුම් ගත කිරීම සහ වියදම්වල ප්‍රමාණාත්මක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී ආයතනය ලබා තිබූ ලාභදායි තත්ත්වය 2012 හා 2013 වර්ෂවලදී අලාභ තත්ත්වයකට පත්වී තිබූ අතර එම අලාභය 2013 වර්ෂයේදී රු.15,608,863 ක් විය. කෙසේ වුවද නැවතත් 2014 වර්ෂයේ සිට ලාභදායි තත්ත්වය වර්ධනය කර ගෙන තිබුණි. මෙයට අතිරේකව සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් වෙනුවෙන් වූ ක්ෂය ගැලපීමෙන් පසු සමස්ත දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 37,152,107 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 4 වගන්තිය ප්‍රකාර ආයතනයේ අරමුණු පහත දැක්වේ.

- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීම.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවයන් ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් බිහිකිරීම.
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහිකිරීම.

- මහජනයාට කාර්යක්ෂමව සේවාවන් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාවැති තැනැත්තන් පුහුණු කිරීම.

(ආ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 04 සහ 05 වගන්තිවල දැක්වෙන පරමාර්ථ, කර්තව්‍යයන් හා ඒවා සාක්ෂාත් කර ගන්නා ආකාරය පැහැදිලිව දැක්වෙන ලෙස ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබූ බව පහත කරුණු අනුව විගණනයේදී නිරීක්ෂණය විය.

- ජාතික භාෂා පරිවර්තක සේවය හා භාෂණ පරිවර්තක සේවය සඳහා පත්කළ යුතු නිලධාරීන්ට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවල නිපුණත්වයක් ඇති කිරීම සඳහා අවශ්‍යවන පුහුණු පාඨමාලා ආරම්භ කර නොතිබුණි.
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් භාෂා පරිවර්තකයන් හා භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීම සඳහා සුදුසුකම්ලත් ගුරුවරුන් පුහුණු කිරීමට පාඨමාලා ආරම්භ කර නොතිබුණි.
- ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා පර්යේෂණ සහ අධ්‍යයනවල ප්‍රතිඵල භාවිතා කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටළු පිළිබඳව පර්යේෂණ සහ අධ්‍යයන පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා සහ විදේශීය භාෂා පිළිබඳ භාෂාමය පර්යේෂණ කටයුතු කරගෙන යාම, ඒවාට සහාය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය නිලධාරීන් සඳහා මට්ටම් 4 ක් යටතේ අර්ධකාලීන භාෂා පුහුණු පංති 265 ක් පැවැත්වීමට රු. 20,083,200 ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ අතර රු. 10,121,425 ක් වැය කර පුහුණු පංති 207 ක් පමණක් පවත්වා තිබුණි.

## 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

ආයතනය සඳහා මූල්‍ය පරිපාලන කාර්ය පරිපාටි සංග්‍රහයක් පිළියෙල කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වෙත රු.45,000 ක් ගෙවා තිබූ නමුත් එම කාර්ය පරිපාටි සංග්‍රහය ආයතනයේ කාර්යයන් ඉටු කිරීමේ දී ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක මට්ටම යටතේ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරී තනතුරු 5 ක් අනුමත වී තිබුණ ද ඉන් 4 ක්ම පුරප්පාඩුව පවතින අතර දැනට සේවයේ යොදවා සිටින නිලධාරියා ද වැඩ තහනමට ලක් වී ඇත. මේ හේතුව නිසා ආයතනය පිහිටුවීමේ පනතේ 5 වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ හා අධ්‍යයනවල ප්‍රතිඵල භාවිතා කිරීමේ අරමුණ ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටළු පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ආ) සම්බන්ධීකරණ සහකාර තනතුරු 8 ක් පුරප්පාඩු වී තිබීම හේතුවෙන් විවිධ පාඨමාලා හා පංතිවල ගෙවීම් නිම කර නොතිබීම, පෞද්ගලික ලිපිගොනු හා වාහන ලිපිගොනු ක්‍රමවත්ව නඩත්තු කර නොතිබීම නිසා ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම කෙරෙහි බලපා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2013 හා 2014 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 මැයි 10 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන ඒකකය සඳහා අභ්‍යන්තර විගණක පමණක් පත්කර තිබුණි.

(ආ) සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් 5 ක් මගින් පෙන්වා දී ඇති ඌනතාවයන් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 134(1) ප්‍රකාර අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයා වෙත තම වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් අභ්‍යන්තර විගණන වාර්තා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.3 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 15 වගන්තිය ප්‍රකාර විගණන කමිටු නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් | නිරීක්ෂණ කෙටියෙන් |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | ආයතනය පැවැත්වූ පාඨමාලාවලට අදාල හිඟ ආදායම් අයකර ගැනීමට අපොහොසත් වීම, ඉකුත් වර්ෂවලට අදාල ගෙවීම් නිරවුල් කර ගැනීමට අපොහොසත් වීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් ප්‍රමාද වීම, සේවක අධීක්ෂණය දුර්වල වීම. |